# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1429/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 04/09/2024 පැය 1455

## මාධ්‍ය නිවේදනය

**01. තීරුබදු රහිතව මෙරටට ආනයනය කරන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය.**

2024.09.04 වන අද දින අළුයම් කාලයේදී කටුනායක ගුවන් තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව මෙරටට ආනයනය කරන ලද විදේශීය දුම්වැටි 22000 (කාටුන් 110) සන්තකයේ තබා ගනිමින් අබුඩාබි සිට ගුවන් මගින් පැමිණි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2024.09.03 වන දින දහවල් කාලයේ කටුනායක පොලිස් වසමේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 3600 (බැරල් 20) ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බෝගහකුඹුර පොලිස් ස්ථානය.**

2024.09.03 වන දින උදෑසන කාලයේ බෝගහකුඹුර පොලිස් වසමේදී බෝගහකුඹුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන බොරලන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බෝගහකුඹුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය**

2024.09.03 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ බස්නාහිර පළාත් දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 330 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන ෆර්ගියුෂන් පාර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**